# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

**අංක 2426/39 – 2025 මාර්තු මස 04 වැනි අඟහරුවාදා – 2025.03.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 18 දරන ආඥාව**

මගේ අංකය: 4-3/6/2019/HW/120
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: THI/LND/L2/ACQUI/156

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙතපවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වන ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

2025 ජනවාරි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.-** ප්‍රාදේශීය ලේකම්, තිහගොඩ.

2. **ඉඩමේ විස්තරය.-** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 334, යටියන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, යටියන ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/THG/2023/183 හා 2024.09.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අක්ෂර A වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0003 ක් පමණ වන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්: :

**01. කැබලි අක්ෂර 'A' - නාගහවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0003**
උතුරට: A. B. K. සුසීත හිමිකම් කියන නාගහවත්ත, A. B. K. සුසීත හිමිකම් කියන ස්ථිර ගොඩනැගිල්ලේ කොටසක් සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); නැගෙනහිරට: A. B. K. සුසීත හිමිකම් කියන ස්ථිර ගොඩනැගිල්ලේ කොටසක් සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය); දකුණට: ඇළ; බටහිරට: ඇළ සහ A. B. K. සුසීත හිමිකම් කියන නාගහවත්ත.

EOG - 03 - 0046